**ඌව පළාත් සභාව - 2014**

**------------------------------**

ඌව පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණන මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට(ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවලඅවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම, හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

2.2.1 පළාත් සභා අරමුදල
---------------------

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2015 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 අනෙකුත් ගිණුම්
-----------------

සමාලෝචිත වර්ෂයට අදාල 2015 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2014 වර්ෂයට අදාල | | | |
|---|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | ඉකුත් වර්ෂවලට අදාලව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 27 | 25 | 02 | - |
| (ii) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 28 | 26 | 02 | - |
| (iii) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 09 | 07 | 02 | - |
| (iv) | අරමුදල් ගිණුම් | 10 | 05 | 05 | 27 |
| (v) | ප්‍රඥප්ති ගිණුම් | 02 | - | 02 | 09 |

2.2.3 පළාත් සභා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන
----------------------------------------

(අ) ඌව පළාත් සමාජ සේවා අරමුදල නමින් මහජන බැංකුවේ බදුල්ල මුතියංගණ ශාඛාවේ පවත්වාගෙන ගිය ජංගම ගිණුම වසා එහි තිබූ රු. 53,748 ක මුදල 2012 මාර්තු 14 දින ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා වෙත එවා තිබුණි. 2011 අගෝස්තු 11 දින සිට මෙම ගිණුමේ ශේෂයක් නොපැවතුණද, සමාලෝචිත වර්ෂයේ ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් යටතේ රු. 46,252 ක ශේෂයක් සහිතව සමාජ සේවා අරමුදල දක්වා තිබුණි. මේ හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවන දැක්වෙන වත්කම් ශේෂය රු. 46,252 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ඌව පළාත් සභා ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ආදායම්වල මුළු ශුද්ධ හිඟ මුදල ලෙස රු. 75,544,161 ක් දක්වා තිබූ නමුත් මුදල ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ආදායම රු. 93,243,837 ක් ලෙස දැක්වීමෙන් 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ශේෂ අතර රු. 17,699,676 වෙනසක් විය.

(ඇ) පළාත් සභාව සඳහා කල්බදු පහසුකම් යටතේ මිලදීගත් වාහන සඳහා කල්බදු වාරික ගෙවීම වෙනුවෙන් ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් නමින් බදුල්ල ලංකා බැංකු ශාඛාවේ විවෘත කර තිබූ ඉතිරිකිරීමේ ගිණුමට බැංකුව විසින් බැරකරන ලද රු. 49,623 ක පොලී මුදල සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඈ) ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී රැස්කර පළාත් සභා අරමුදල වෙත ප්‍රේෂණය නොකර රැස්කිරීමේ ගිණුමේ රඳවාගෙන තිබූ මුද්දර ගාස්තු ආදායම රු. 81,700 ක් වූ අතර එම ආදායම මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ආදායමක් ලෙස අනාවරණය නොකිරීමෙන් මුද්දර ගාස්තු ආදායම රු. 81,700 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2014 ජනවාරි 01 දිනට පැවති රු. 47,000 ක ශේෂයද ඇතුළුව ඌව පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ රැස්කරන ලද රු. 3,800,665 ක් වූ පිරිවැටුම් බදු ආදායම පළාත් සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල රු. 3,326,361 ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ පිරිවැටුම් බදු ආදායම රු. 474,304 ක් අඩුවෙන් දක්වා තිබුණි. එම ආදායම තුළ ඇතුළත් රු. 93,300 ක් 2014 දෙසැම්බර් 31 දින පළාත් සභා අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 31 දිනට අනුමත අත්තිකාරම් ගිණුම් කටයුතු 06 කින් අයවිය යුතු රු. 38,098,072 ක් හා 2005, 2006 හා 2007 වර්ෂවලට අයත් ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලයේ රු. 3,962,376 ක්වූ නිරවුල් නොකළ ශේෂයන් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර නොතිබුණි.

(උ) 1990 වර්ෂයේදී ඌව පළාත් සභාවේ මූල්‍ය අංශයේ සිදුවී ඇති මුදල් වංචාව සම්බන්ධයෙන් ඌව පළාත්බද මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයා විසින් පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගණකාධිකාරිවරයා වෙත එවා ඇති 2012 අගෝස්තු 27 දිනැති ලිපිය අනුව 2006 වර්ෂයට පෙර එම අධිකරණයේ පැවති නඩු වාර්තා රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව විනාශකර ඇති බැවින් මේ පිළිබඳ තොරතුරු සොයාගැනීම ගැටළුවක් බව දන්වා තිබුණි. ඒ අනුව පළාත් සභාවේ මූල්‍ය අංශය විසින් නඩුවක් පවතින බව විගණනයට දන්වා තිබීමත් මූල්‍ය ප්‍රකාශන වල මෙම වංචාව පිළිබඳ සඳහන් කර තිබීමත් සිදුකර ඇත්තේ මෙම නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව නොවන බව නිරීක්ෂණය විය.

(ඌ) බීජ අර්තාපල් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 41,011,755 ක්වූ ශේෂය වර්ෂ 10 ට අධික කාලයක් පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් නිරූපනය කර තිබුණි. මෙම ශේෂය අදාල නිලධාරීන්ගෙන් මාසිකව අයකරගත යුතු වුවද අයකර ගැනීමේ ප්‍රතිශතය සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 05 ක කාලය තුළ සියයට 05 ක්ව පැවතීමෙන් එම කාර්යය නිසි පරිදි සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

(එ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිදුවී ඇති මුදල් වංචාවට වර්ෂ 10 කට අධික කාලයක් ගතවී ඇති අතර 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නිරවුල් නොවූ ශේෂය රු. 440,990 ක් විය.

(ඒ) සමාලෝචිත වර්ෂයේ ඌව පළාත් සභා මූල්‍ය ප්‍රකාශන අනුව සමස්ථ පුනරාවර්තන වියදම රු. 13,869,334,026 ක්ද සමස්ථ මූලධන වියදම රු. 4,447,953,952 ක් විය. එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් විගණනයට ඉදිරිපත් කළ විසර්ජන ගිණුම් අනුව සමස්ථ පුනරාවර්තන වියදම රු. 13,705,074,171 ක් හා සමස්ථ මූලධන වියදම රු. 4,453,696,237 ක් වූයෙන් පුනරාවර්තන හා මූලධන වියදම් අතර පිළිවෙලින් රු. 164,259,855 ක හා රු. 5,742,285 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ඌව පළාත් සභා මූල්‍ය ප්‍රකාශන, ජාත්‍යන්තර රාජ්‍ය අංශය සඳහා භාවිතා කරන අයුරින් මුදල් පදනම මත පිළියෙල කර ඇති බවට "ගිණුම්කරණ ප්‍රතිපත්තිවල" හෙළිදරව් කර තිබුණි. එසේ වුවත් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වත්කම්,වගකීම්,ආදායම් හා වියදම් නිශ්චිත පදනමකින් තොරව ගිණුම්ගතකර ඇති බවත්, නිරීක්ෂණය විය.

2.2.5 නොසැසඳු පාලන ගිණුම්
---------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පළාත් රාජ්‍ය නිලධාරීන්ට ණය හා අත්තිකාරම් ගිණුම් වල ශේෂයන් හා පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ කාර්යාල 06 ක් විසින් ඉදිරිපත් කළ ණය හා අත්තිකාරම් ගිණුම්වල දැක්වෙන ශේෂයන් අතර රු. 94,143,750 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන නොපියවූ අග්‍රිම ශේෂයන් හා පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ කාර්යාල 09 ක අග්‍රිම ගිණුම්වල දැක්වෙන ශේෂයන් අතර රු. 4,200,483 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පොදු තැන්පත් ශේෂයන් හා පළාත් සභාවේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ කාර්යාල 03 ක පොදු තැන්පත් ගිණුම්වල දැක්වෙන ශේෂයන් අතර රු. 6,147,090 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.6 අග්‍රිම ගිණුම්

-------------

2014 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක්ද ඇතුළුව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 27 කට අදාලව නිරවුල් නොකල අග්‍රිම ශේෂයන්ගේ එකතුව රු. 36,160,493 විය.

2.2.7 පොදු තැන්පත් ගිණුම්

------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණ පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 29 ක තැන්පත් ශේෂවල එකතුව රු. 62,357,559 ක් මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව නියාදනය කිරීමටකටයුතු කර නොතිබුණි.

(ආ) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2011 සැප්තැම්බර් මාසයේ සිට 2012 සැප්තැම්බර් මාසය දක්වා තැන්පත් කරන ලද රු. 97,185 ක් වටිනා තැන්පත් 4 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.8 පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

-----------------------------------------------

(අ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 3.1, 3.2 ඡේදයන් හා 2004 ජනවාරි 08 දිනැති අංක 2004/01 දරන ඌව පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවෙන් මධ්‍යම රජයේ එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කාර්යාල හා වෙනත් පළාත් සභාවලට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 36 දෙනෙකුගේ රු. 1,131,024 ක්වූ ණය ශේෂ එකවර අයකර ගැනීමට හෝ ණය වාරිකය හා පොලිය මාසිකව ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. මීට අමතරව මධ්‍යම රජයේ එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කාර්යාල හා වෙනත් පළාත් සභාවලින් මෙම පළාත් සභාවට ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 15 දෙනෙකුගේ රු. 344,022 ක්වූ ණය ශේෂ එකවර පියවීමට හෝ ණය වාරිකය හා පොලිය මාසිකව පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවය අතහැර ගිය, වැඩ තහනම්කළ, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 218 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 5,799,903 ක්වූ ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2, 4.5, 4.6 වගන්ති අනුව විශ්‍රාම පාරිතෝෂිකයෙන්, ඇපකරුවන්ගෙන් හෝ නීතිපතිගෙන් උපදෙස් ලබාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මියගිය පළාත් සභා මන්ත්‍රීවරු තිදෙනෙකුගෙන් අයනොවී පවතින රු.329,531 ක ණය ශේෂය ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.9 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

(අ) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 2,994,038 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) අවකාශ කළමනාකරණය යටතේ ප්‍රධාන ලේකම් කාර්යාලය සැකසීමේදී කාර්යාලයට නව උපකරණ ලබාගෙන තිබුණු අතර භාවිතයෙන් ඉවත් කරන ලද කාර්යාල උපකරණ සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර නොතිබීමෙන් ඉවත් කරන ලද කාර්යාලයීය උපකරණවල ප්‍රමාණ පිළිබඳ විගණනයේදී ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

2.2.10 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ආයතන සංග්‍රහය | | |
| (I) | VII පරිච්ඡේදයේ 12 වගන්තිය | 81,496 | බදුල්ල පරිවාස කාර්යාලයේ පරිවාස නිලධාරී II තනතුරේ සේවය කරන නිලධාරියෙක් බදුල්ල හා මහියංගණ පරිවාස කාර්යාලයේ පරිවාස නිලධාරී I තනතුරේ වැඩ බැලීම සිදුකර තිබූ අතර තනතුරු දෙකක වැඩ බැලීම වෙනුවෙන් 2014 ජනවාරි සිට අගෝස්තු දක්වා වැඩබැලීමේ දීමනා ලබාගෙන තිබුණි. |
| (II) | VII පරිච්ඡේදයේ 12.2.1, 12.2.2 වගන්ති සහ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 113 වගන්තිය | 105,373 | යම් තනතුරක වැඩ බැලීම සඳහා පත්කළ හැකිවන්නේ එම තනතුරට සමාන හෝ එම තනතුරට ආසන්න පහල තනතුරක සේවයේ යෙදී සිටින නිලධාරියකු වුවද එයට පටහැනිව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි SL-1-2006 දරන වැටුප් පරිමාණය හිමි පළාත් ඉඩම් කොමසාරිස් තනතුර සඳහා 06/2006 හි හි SL-3-2006 දරන වැටුප් පරිමාණය හිමි ඉහල තනතුරක සේවය කරන අමාත්‍යාංශයක ලේකම්වරයෙකු 2013 ජුලි 09 දින සිට ක්‍රියාත්මක පරිදි වැඩ බැලීම සඳහා පත්කර තිබූ අතර ඒ වෙනුවෙන් 2014 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. |
| (III) | VIII පරිච්ඡේදයේ 10 වගන්තිය | 70,605 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් සමාලෝචිත වර්ෂයේදී විධිවිධානවලට පටහැනිව නිවාඩු දින වැටුප් ලබාගෙන තිබුණි. |
| (IV) | XIX පරිච්ඡේදයේ 5 වගන්ති | 6,187,186 | බදුල්ල නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පාලනය වන නිල නිවාස වල පදිංචි නිලධාරින්ගෙන් 2009 වර්ෂය සිට 2014 වර්ෂය දක්වා කුලී අයකර ගෙන නොතිබුණි. |
| (V) | XIX පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය | - | උපලේඛනගත නිවාස හිමි නිලධාරින්ගේ මාසික වැටුපෙන් සියයට 10 ක් නිවාස කුලී ලෙස අයකළ යුතු වුවද ඊට පටහැනිව 2008 අගෝස්තු 01 දින සිට උපලේඛනගත නිවාස හිමි පළාත් සභාවේ ලේකම්වරුන්ගෙන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගෙන් නිවාස කුලී ලෙස රු. 500 ක මාසික නාමික කුලියක් අයකරමින් තිබුණි. |
| (VI) | XIX පරිච්ඡේදයේ 5.4 හා 5.4.1 වගන්තිය | - | බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් රජයේ නිවාස 77 ක් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිවාස කුලී අයකර නොතිබුණි. |
| (VII) | XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය | (අ) | රජයේ නිවාසයක පදිංචි වී සිටිය හැකි කාලය වර්ෂ 05 ක් වුවද මොණරාගල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් සාද නිවාසයේ මොනරාගල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය |

සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සේවය කරන නිලධාරියෙක් විගණන දිනය වූ 2014 නොවැම්බර් 14 දින වන විට වසර 13 මාස 06 ක කාලයක් පදිංචි වී තිබුණි. මේ හේතුවෙන් වෙනත් නිලධාරීන් හෝ නිලධාරිණියන් කිහිපදෙනෙකුටම පදිංචි වීමට තිබුණු අවස්ථා මඟ හැරී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකු බදු කාලය ඉක්මවා රජයේ නිවාසවල වසර 07 සිට වසර 17 දක්වා කාලයක් පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

(ආ) ඌව පළාත් සභා මුදල් රීති
----------------------------

| | | | |
|---|---|---|---|
| (I) | මුදල් රීති 137.3 | 24,288 | මහියංගණ මූලික රෝහලේ ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් 2014 ජනවාරි සහ මාර්තු මාසය වෙනුවෙන් ගිවිසුම්ගත මුදල ඉක්මවා වැඩිපුර ගෙවා තිබුණි. |
| (II) | මුදල් රීති 216.1 | 13,898,258 | 2013 හා 2014 වර්ෂවලදී විදේශ පුහුණු වැඩසටහන් සඳහා පළාත් සභාවේ එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල වලින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වෙත එවන ලද මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන 2015 වර්ෂයේ විදේශ පුහුණු වැඩසටහන් වෙනුවෙන් වැය කර තිබුණි. |
| (III) | මුදල් රීති 237 (ආ) | 1,132,075 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ගබඩා සැපයුම් සඳහා ගෙවීම් සහතික කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවට වූ තොග සහතික නොමැතිව වවුචර් 53 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |
| (IV) | මුදල් රීති 751.1. | - | ඌව පරණගම, බණ්ඩාරවෙල හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු වර්ග 16 කට අයත් භාණ්ඩ හා ද්‍රව්‍ය ඒකක 4677 ක් තොග පොත්වල ඇතුළත් කර නොතිබුණි. |
| (V) | මුදල් රීති 846.1 | 117,347 | ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික දුරකථන සමාගමකින් නව දුරකථන සබඳතා 25 ක් මිලදී ගෙන ඒ සඳහා මාසික බිල්පත් ගෙවා තිබුණද ඒ සඳහා ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
---------------------------

| | | | |
|---|---|---|---|
| (I) | 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන චක්‍රලේඛය | 54,029 | මාසික ප්‍රවාහන දීමනාව ලබා ගන්නා ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් වරයා චක්‍රලේඛයේ II වන ඡේදයට පටහැනිව සංචිත වාහන භාවිතා කරමින් ඉන්ධන ලීටර් 2992 ක් පාවිච්චි කර තිබුණි. |
| (II) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | - | පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 04 ක නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (III) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | 1,296,194 | අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රාජකාරි වේලාවන් ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කළයුතු වුවත් එම විධිවිධාන වලට පටහැනිව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලයේ කාර්ය මණ්ඩලය අතිකාල හා නිවාඩු දින වැටුප් ලබාගෙන තිබුණි. |
| (ඇ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | | |
| (I) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1. ඇ වගන්තිය | - | ඌව පළාත් සභා සංකීර්ණය ඇතුළු පළාත් සභාවට අයත් කාර්යාලවලට 2014 වර්ෂය සඳහා ආරක්ෂක සේවය හා පවිත්‍රතා සේවය ලබාගැනීමේදී සුදුසුකම්ලත්, උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනය සහභාගිවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීම යන අරමුණු වලින් බැහැරව කටයුතු කර තිබුණි. |
| (II) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8 වගන්තිය | - | මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර වලට ගණිත උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි. |
| (III) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 වගන්තිය | - | වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ අවම වශයෙන් සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් ලබාගත් මිල ගණන් මත සැපයුම්කරුවන් තෝරාගැනීම සිදුකළයුතු වුවද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේදී අවස්ථා 13 කදී එලෙස කටයුතු කර නොතිබුණි. |
| (IV) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.ආ වගන්තිය | 208,310 | 2014 ජනවාරි 01 දින සිට පෙබරවාරි 26 දින දක්වා ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවිත්‍රතා සේවාව සැපයීම සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකින් තොරව එක්තරා සමාගමකට ලබාදී තිබුණි. |
| (ඉ) | වෙනත් චක්‍රලේඛ | | |
| (I) | 1996 අගෝස්තු 01 දිනැති අංක 04/10 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | - | බදුල්ල හා හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බදු ඒකක පිහිටුවා බදු එකතුකරන්නන්ගේ ලැයිස්තුව, පාලන ගිණුම, හිඟ පාලන ගිණුම යන ලියකියවිලි යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (II) | ඌව පළාත් ප්‍රධාන ලේකම් හා අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ 2006 සැප්තැම්බර් 20 දිනැති ආ.මා.සං. 73/2006 දරන ලිපිය | 580,000 | පළාත් සභා අමාත්‍යවරයකුගේ රාජකාරි ගමන් වෙනුවෙන් මසකට රු.10,000 ක උපරිමයකට යටත්ව සංයුක්ත දීමනාවක් ගෙවිය යුතු වුවද ඊට පටහැනිව ඌව පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන,සත්ත්ව නිෂ්පාදන,මිරිදිය ධිවර, පරිසර හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙනුවෙන් 2009 සැප්තැම්බර් සිට 2014 ජූනි දක්වා කාල පරිච්ඡේදය තුළ මසකට ගමන් වියදම් දීමනා වශයෙන් රු. 20,000 බැගින් ගෙවා තිබුණි. |

#### 2.2.11 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ඌව පළාත් සභා මුදල් රීති 503 නියමයන්ට පටහැනිව අත්තිකාරම් ගිණුම් විෂයයන් 04 ක හර ශේෂයේ උපරිම සීමාව රු. 63,047,324 කින් ඉක්මවා තිබුණ අතර විෂයයන් 07 ක ලැබීම්වල අවම සීමාව රු. 76,323,592 කින් පහත වැටී තිබුණි.

3. ආදායම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇල්ල, බදුල්ල, ඌවපරණගම, පස්සර, සොරණාතොට හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක වාර්ෂික අවසර පත්‍ර යටතේ බදුදී තිබූ ඉඩම් වෙනුවෙන් රු.184,711 ක බදු මුදලක් සහ රු.24,593 ක දඩ මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගෙන නොතිබුණි.

(ආ) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වාර්ෂික බලපත්‍ර යටතේ ලබාදී තිබූ බදුකර 04 ක, 2008 – 2012 කාලය වෙනුවෙන් ග්‍රාම නිලධාරීන් විසින් අයකර තිබූ රු.13,229 ක බදු මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරදී නොතිබුණි.

(ඇ) බදුල්ල, ඌවපරණගම, හපුතලේ, මහියංගණය හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලීනව ඉඩම් බදුදීම මත බදුකරුවන් 48 දෙනෙකුගෙන් රු.5,961,493 ක වාර්ෂික බදු, වාර/දඩ මුදල් සහ රු.556,259 ක පොලී මුදල් අයකර ගෙන නොතිබුණි.

(ඈ) හපුතලේ හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් බදුකරුවන් 14 දෙනකුගෙන් රු.9,937,073 ක වාර්ෂික බලපත්‍ර ගාස්තු වාර / බදු මුදල් අඩුවෙන් අයකර තිබුණි.

(ඉ) 2007 වර්ෂයේ සිට පෞද්ගලික සමාගමක් විසින් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ජනතාපුර ග්‍රාම නිළධාරී වසමෙහි පිහිටි අළුබෝගොල්ල නමැති රජයේ ඉඩමේ දුරකථන සන්නිවේදන කුළුණක් ඉදිකර පවත්වාගෙන ගොස් තිබුණි. 2014 දෙසැම්බර් මාසය දක්වා ඉඩමටඅදාල බදුකරය ලබා නොදීම නිසා රජයේ ඉඩම භාවිතයට ගැනීම වෙනුවෙන් කිසිදු බදු මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඊ) 2014 වර්ෂයට ලුණුගල අංක 02 රා තැබෑරුම් රේන්දය විකිණීම සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් මිල ගණන් කැඳවීමේදී , වැඩිම මිල ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුගේ රු.7,030,000 ක්වූ මිල, සුරාබදු කොමසාරිස් ජනරාල් ගේ රු.9,500,000 ක්වූ තක්සේරු මිලට වඩා අඩුවී තිබුණි. තක්සේරු අගය මත රා තැබෑරුම් රේන්දය ලබාගැනීමට ටෙන්ඩර්කරු විමසීම හෝ ටෙන්ඩර් දැන්වීමට අනුව රේන්දය නැවත විකිණීමට කටයුතු නොකර, සුරාබදු කොමසාරිස්ගේ තක්සේරු අගයෙන් 10% ක් අඩුකළ රු. 8,500,000 ක මුදලකට, වැඩිම මිල ඉදිරිපත්කළ ටෙන්ඩර්කරුට විකිණීම නිසා ලබාගත හැකිව තිබූ බලපත්‍ර අදායමෙන්,රු.1,000,000 ක මුදලක් අහිමි වී තිබුණි.

(උ) හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2008-2015 කාලය වෙනුවෙන් මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේදී බලපත්‍රලාභීන් දෙදෙනෙකු වෙත ලබාදී තිබූ බලපත්‍ර වෙනුවෙන් ගාස්තු රු.235,000 ක් අඩුවෙන් අයකිරීම හා අවස්ථා 05 කදි ප්‍රමාද වී බලපත්‍ර ගාස්තු ගෙවීම වෙනුවෙන් අයකළ යුතු දඩ මුදල් රු.3,300 ක් අයනොකිරීම නිසා අහිමි වූ ගාස්තු හා දඩ මුදල් එකතුව රු.238,300 ක් විය.

4. මූල්‍ය සමාලෝචනය

-----------------------

4.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 711,759,187 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 20,446,949 ක් විය.

4.2 ආදායම හා වියදම

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ හා ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ආදායම

| | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පළාත් සහා විෂයයන්ට අදාල ආදායම් | | | | | | |
| බදු ආදායම | 2,102,456,000 | 2,051,316,974 | (51,139,026) | 2,241,565,000 | 1,757,156,247 | (484,408,753) |
| බදු නොවන ආදායම | 277,544,000 | 545,164,047 | 267,620,047 | 247,845,000 | 404,555,653 | 156,710,653 |
| රජයේ ප්‍රධාන | 19,380,202,600 | 16,432,566,144 | (2,947,636,456) | 15,311,208,000 | 14,518,293,631 | (792,914,369) |
| | 21,760,202,600 | 19,029,047,165 | (2,731,155,435) | 17,800,618,000 | 16,680,005,531 | (1,120,612,469) |

වියදම

| | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 11,289,862,552 | 11,053,931,370 | 235,931,182 | 10,335,715,494 | 10,008,174,243 | 327,541,251 |
| අනෙකුත් -පුනරාවර්තන | 3,716,408,098 | 2,815,402,656 | 901,005,442 | 3,028,201,469 | 2,521,023,080 | 507,178,389 |
| උප එකතුව | 15,006,270,650 | 13,869,334,026 | 1,136,936,624 | 13,363,916,963 | 12,529,197,323 | 834,719,640 |
| රාජ්‍ය ආයෝජන | 4,995,084,591 | 4,447,953,952 | 547,130,639 | 3,667,406,252 | 4,130,361,259 | 462,955,007 |
| | 20,001,355,241 | 18,317,287,978 | 1,684,067,263 | 17,031,323,215 | 16,659,558,582 | 1,297,674,647 |

සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු. 18,317,287,978 ක් විය. ඉන් සියයට 75 ක් පුනරාවර්තන වියදම් වූ අතර සියයට 25 ක් මූලධන වියදම් විය

## 5. අරමුදල් හා වාණිජ අත්තිකාරම් ගිණුම්

### 5.1 අරමුදල් ගිණුම්

#### 5.1.1 ආණ්ඩුකාරවර අරමුදල

(අ) ඌව පළාත් ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ ප්‍රඥප්තියේ අංක 04 වගන්තිය ප්‍රකාර අරමුදලේ මුදල් යෙදවිය යුතු කාර්යයන් 06 න් සමාලෝචිත වර්ෂයේදී සියයට 82 ක් අරමුදල් යොදවා තිබුණේ කාර්යයන් 02 ක් සඳහා පමණි. ඒ අනුව ඉතිරි කාර්යයන් සියල්ල සඳහා අරමුදල් යොදවා තිබුණේ සියයට 18 ක් පමණි.

(ආ) ස්ථාවර තැන්පතු යලි ආයෝජනයේදී අරමුදලට වාසිසහගත පොලී ආදායමක් උපයාගත හැකි පරිදි මූල්‍ය වෙළඳපොල පොලී පිළිබඳ විමසීම් කර ඵලදායි ලෙස ආයෝජනය කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයට වඩා වැඩියෙන් 2014 වර්ෂයේදී ආණ්ඩුකාරවර අරමුදලේ අරමුණු ඉටුකරගැනීම සඳහා මුදල් යොදවා තිබුණද 2014 වසර අවසානයට පැවති ස්ථාවර තැන්පතු වල ශේෂය රු. 7,847,400 ක මුදලට සාපේක්ෂව ජනතාවගේ අභිවෘද්ධිය සඳහා යොදවා ඇති මුදල රු. 2,356,518 ක් එනම් සියයට 30 ක් පමණ විය. ඒ අනුව අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමට වඩා ස්ථාවර තැන්පතු වල ආයෝජනය පිළිබඳ වැඩි අවධානයක් යොමුකර ඇති බව නිරීක්ෂණය විය.

5.1.2 ප්‍රධාන අමාත්‍ය අරමුදල

(අ) 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී ප්‍රධාන අමාත්‍ය අරමුදලට ලද ආදායම රු.1,810,521 කින් වැඩි වී ඇති අතර ආධාර සඳහා දරන ලද මුළු වියදම රු. 1,384,080 කින් සහ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 42 කින් අඩුවී තිබුණි.

(ආ) ප්‍රධාන අමාත්‍ය අරමුදල් ප්‍රඥප්තියේ 11 වගන්තිය අනුව මණ්ඩලයේ බලතල, කාර්යය සහ කර්තව්‍යය සිදුකිරීම සහ ඉටුකිරීම කෙරෙහි බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ඊට අනුශාංගික කවර වුවද කාරණයක් සඳහා අවශ්‍යයැයි මණ්ඩලය සලකනු ලබන රීති සෑදීමට මණ්ඩලයට බලතල ඇතත් විගණිත දිනය වූ 2015 මැයි 12 දක්වාම එවැනි රීති සාදා නොතිබුණි.

5.1.3 ඌව ව්‍යවසාය සංවර්ධන අරමුදල

ඌව ව්‍යවසාය සංවර්ධන අරමුදලේ 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 6,722,202 ක් විය.

5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

5.2.1 වඩුපාසල් අත්තිකාරම් ගිණුම

2014 වර්ෂයේදී වඩු පුහුණුව සඳහා වඩු පුහුණු මධ්‍යස්ථානවලට බඳවාගත් අභ්‍යාසලාභීන් සංඛ්‍යාව 69 දෙනෙකු වන නමුත් පුහුණුව සම්පූර්ණ කළ අභ්‍යාසලිභීන් සංඛ්‍යාව 22 ක් වූ අතර විවිධ හේතුන් නිසා අභ්‍යාසලාභීන් 41 දෙනෙකු පාඨමාලාව හැර ගොස් තිබුණි.

5.2.2 ලුහු ඉංජිනේරු අත්තිකාරම් ගිණුම

(අ) රාජ්‍ය හා පෞද්ගලික ඇණවුම් සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීම, යකඩ භාණ්ඩ හා දොර ජනෙල් සෑදීම පිළිබඳ ආධුනිකයන්ට පුහුණුවක් ලබාදීම ලුහු ඉංජිනේරු අභ්‍යාස ආයතන ආරම්භ කිරීම මූලික අරමුණ වුවත් 2010 වර්ෂයෙන් පසුව බෙරගල ලුහු ඉංජිනේරු අභ්‍යාස ආයතනයට පුහුණුව සඳහා එක් අභ්‍යාසලාභියෙකු පමණක් බඳවා ගෙන තිබුණු අතර මැදගම ලුහු ඉංජිනේරු ආයතනයට 2014 වර්ෂය සඳහා අභ්‍යාසලාභීන් 18 දෙනෙකු බඳවාගෙන තිබුණි.2010-2014 කාලපරිච්ඡේදය තුළදී බෙරගල හා මැදගම ලුහු ඉංජිනේරු අභ්‍යාස ආයතන සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | බඳවාගත් අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | බෙරගල | මැදගම |
| 2010 | නැත | 10 |
| 2011 | නැත | 10 |
| 2012 | නැත | 01 |
| 2013 | නැත | 08 |
| 2014 | 01 | 18 |

(ආ) බෙරගල හා මැදගම ලුහු ඉංජිනේරු අභ්‍යාස ආයතන සතුව ගොඩනැගිලි පහසුකම්, යන්ත්‍රෝපකරණ හා පළපුරුදු තාක්ෂණ නිලධාරීන්ගේ සේවය තිබියදීත් අභ්‍යාසලාභීන් බඳවාගෙන පුහුණුවීම් ලබාදීම තුළින් නිෂ්පාදනය වැඩි කිරීමට කටයුතු කර නොතිබුණි. 2013 හා 2014 වර්ෂවලදී යථොක්ත ආයතන වෙත නිෂ්පාදනය සඳහා ලැබී තිබුණු ඇණවුම් වෙනුවෙන් පිටතින් කාර්මිකයින්ගේ සේවය ලබාගෙන තිබුණි.

5.2.3 ඔක්කම්පිටිය බීජ ගොවිපල අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.2,558,566 ක් වූ වැඩෙන වගාව තක්සේරු කර ඇති පදනම පිළිබඳ විස්තර හෙළිදරව් කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති ලැබිය යුතුව තිබූ රු.2,207,911 ක් 2014 අවසාන ගිණුම සැකසීමේදී නිවැරදි කර නොතිබුණි.

(ඇ) වසර කීපයක සිට පැවත එන පිරිවැටුම් බදු ගිණුමේ රු.333,561 ක ශේෂය නිරවුල් කර නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය අනුව ණයගැති ශේෂය රු.322,198 ක් වන අතර එම ශේෂය සත්‍යාපනය කිරීමට ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් නොවීය.

5.2.4 දිසායාන්ත්‍රික වැඩපල අත්තිකාරම් ගිණුම

---

දිසායාන්ත්‍රික වැඩපල අත්තිකාරම් ගිණුමේ 2011 වර්ෂයේ සිට පැවත එන 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු නොකල හිඟ ආදායම් වටිනාකම රු. 4,674,336 ක් විය.

6. මෙහෙයුම් සමාලෝචනය

---

6.1 කාර්ය සාධනය

---

6.1.1 රජයේ ප්‍රදාන

---

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන සහ ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ශුද්ධ ප්‍රතිපාදනය<br>රු. | උපයෝජනය<br>රු. | ඉතිරිවීම්<br>රු. | ඉතිරිවීම් ප්‍රතිශතය<br>% |
|---|---:|---:|---:|---:|
| අධ්‍යාපන | 245,840,000 | 245,840,000 | - | - |
| සෞඛ්‍ය | 245,840,000 | 206,000,000 | 39,840,000 | 10 |
| සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය | 180,000 | 180,000 | - | - |
| අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය | 285,000,000 | 281,468,037 | 3,531,963 | - |
| යුනිසෙෆ් වැඩසටහන | 38,775,600 | 37,080,200 | 1,695,400 | - |
| සමාජ සේවා | 13,000,000 | 13,000,000 | - | - |
| පළාත් මාර්ග ව්‍යාපෘතිය | 1,810,000,000 | 1,599,865,908 | 210,134,092 | 10 |
| යටිතල පහසුකම් | 906,595,000 | 906,595,000 | - | - |
| ආර්ථික සංවර්ධන | 800,000,000 | 352,405,000 | 447,595,000 | 50 |
| ආයතනික ප්‍රාග්ධන වියදම් | 111,000,000 | 110,160,000 | 840,000 | - |

6.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අඛණ්ඩ වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 1492.2 ක ඇස්තමේන්තු අගයකට වූ යෝජනා 2646 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා |
|---|---|---|---|
| සම්පූර්ණයෙන් නිමකළ | 1682 | 745 | 2427 |
| 50% ට වඩා වැඩියෙන් නිමකළ | 78 | 07 | 85 |
| 50% ට වඩා අඩුවෙන් නිමකළ | 31 | 02 | 33 |
| ආරම්භකර නොතිබූ | 54 | - | 54 |
| මතභේදකාරී/ ප්‍රශ්නාකාරී තත්ත්වයන් යටතේ වූ | 47 | - | 47 |
| එකතුව | 1892 | 754 | 2646 |

6.1.3 වෙනත් නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල 2013 දෙසැම්බර් 01 දිනට කෝප්සිටි, මිනිකෝප් සිටි හා මෙගා කෝප් සිටි 95 ක් අතුරින් 68 ක් රු.4,572,088 ක අලාභයක් ලබා අසාර්ථක තත්වයේ පැවතියද ලාභ ලබන තත්වයට ගෙන ඒමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් රාජකාරී සම්බන්ධයෙන් 2014 වර්ෂයේදී ළඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් සමඟ ලබාගෙන ඇති ප්‍රගතිය සැසඳීමේදී බොහෝ විෂයන් සම්බන්ධයෙන් අපේක්ෂිත ඉලක්කයන්ගෙන් 50% ක්වත් ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය. පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26 සඳහා එක් කාර්යාලයකට දෙපාර්තමේන්තු නිලධාරීන් තිදෙනෙකු බැගින් අනුයුක්ත කර ඇති අතර ඔවුන්ගේ වැටුපට අමතරව 2014 වර්ෂය තුලදී පමණක් පරිවර්තිත ගමන් වියදම් වශයෙන් රු.1,302,316 ක මුදලක් දෙපාර්තමේන්තුව විසින් වැයකර තිබුණි.

(ඇ) වැලිමඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාශ 35 ක් අයත් වන අතර එයින් 2014 වර්ෂයේදී දින 07 ක් තුළ කොට්ඨාශ 13 ක් පමණක් මහජන සෞඛ්‍ය හෙද සොයුරිය අධීක්ෂණය කර තිබුණි. එම කොට්ඨාශ බොහොමයක ගෘහ පිවිසුම්, ගර්භණී මවුවරුන්ගේ පූර්ව ප්‍රසව ගෘහ පිවිසුම්, පසු ප්‍රසව ළදරු ළමා ගෘහ පිවිසුම් හා මවුවරුන්ගේ ගෘහ පිවිසුම් කාර්යයන් ඉතාම දුර්වල තත්වයක පැවතුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010, 2011 හා 2012 වර්ෂවල ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, කුඩා වැවිලි ව්‍යවසාය සංවර්ධන පදනම සහ බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කනවේගල්ල, බුලුපිටිය, නිල්ගල යන වසම් 03 හි රබර් වගාකරුවන් 261 ක් වෙත ඉඩම් අක්කර 520 ක් බෙදා දී තිබූ අතර වගාකරුවන්ට ඉඩම් බෙදාදුන් පදනම විගණනයට අනාවරණය නොවීය. තවද ගිවිසුමේ 4.3 කොන්දේසිය ප්‍රකාරව ගිවිසුම් ගත දින සිට වසර 05 ක් ගත වන තුරු වසරක් පාසා ගිවිසුම දීර්ඝ කර ගත යුතු බව දක්වා තිබූ නමුත් එසේ වුවද 2014 නොවැම්බර් 27 දක්වාත් ගිවිසුම් 261 ක කාලය දීර්ඝ කර නොතිබුණි.

(ආ) දියතලාව මූලික රෝහලේ අමු ආහාර මිලදී ගැනීමේදී ඌව පළාත් සභා මුදල් රීති 137(2) හා 156(7) ට පටහැනිව කටයුතු කරමින් ගිවිසුම ප්‍රකාරව අනුමත කැම වට්ටෝරු සඳහා ලබාදිය යුතු අමු ආහාර ද්‍රව්‍ය නොසපයා වෙළඳපොල අවම මිල ගණන් යටතේ පවතින ආහාර සැපයීම මඟින් අමතර ලාභයක් ඉපයීමට කොන්ත්‍රාත්කරුට ඉඩ ප්‍රස්ථාව සලසා දී තිබුණි.

(ඇ) දියතලාව මූලික රෝහල, බදුල්ල නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හා වැලිමඩ මූලික රෝහලේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා යොදාගනු ලබන පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය වෙනුවෙන් වර්ෂයකට 1,645,262 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවන අතර එම

භාණ්ඩ සත්‍ය වශයෙන්ම පිරිසිදු කිරීමේ කටයුතු සඳහා යොදනු ලැබුවද යන්න පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කොට නොතිබුණි. ඌව පළාත් සභා මුදල් රීති 752, 753 ප්‍රකාරව භාණ්ඩ භාරගැනීම හෝ නිකුත් කිරීම සම්බන්ධ ලේඛන ආයතන විසින් නඩත්තු කොට නොතිබු අතර රීති 237(ආ) විධිවිධාන වලට පටහැනිව භාණ්ඩ සත්‍ය වශයෙන් ලද බව තහවුරු කර ගෙන නොතිබුණි.

(ඇ) දියතලාව මූලික රෝහල පිරිසිදු කිරීමේ සේවා ගිවිසුමේ 20 වන වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු වෙත බඩු බාහිරාදිය ගබඩා කිරීමට හා කටයුතු පවත්වාගෙන යාමට යම් ස්ථානයක් හෝ කාමරයක් සපයන ලද්දේ නම් එයට සාධාරණ කුලියක් අයකළ යුතු වුවද එසේ කුලී අය නොකොට පැරණි බාහිර රෝගී අංශයේ කොටසක් අදාල ආයතනයට ලබාදී තිබුණි.

(ඉ) බණ්ඩාරවෙල දිසා රෝහලට අයත් ඉඩම තුල වර්ග මීටර් 67 ක ප්‍රමාණයක (පර්චස් 2.66) අනවසරයෙන් නිවාස ඉදිකර ඇති බවට මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2013 නොවැම්බර් 25 දින වාර්තාවක් ලබාදී ඇතත් එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) වැලිමඩ මූලික රෝහල පිහිටි නියදගල පතන ඉඩමෙන් අක්කර 01 පර්චස් 0.8 ක් අනවසර පදිංචිකරුවන් පදිංචි වී ස්ථිර ගොඩනැගිලි ඉදිකර ඇති බව අනාවරණය වූ අතර රෝහල් ඉඩම 1996 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා මායිම් නිරවුල් කිරීම සඳහා හය වතාවක් මායිම පෙන්වා දී මැනුම් කටයුතු සිදුකර ඇතත් ඉඩම ආරක්ෂා කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. අනවසර පදිංචිකරුවන් එම ඉඩමෙන් ඉවත් කර 1979 අංක 07 දරණ ඉඩම් සන්තකය ආපසු ලබාගැනීමේ පනත අනුව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත නිරවුල් භුක්තිය ලබාගැනීමට පියවරගෙන නොතිබුණි.

(උ) ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවකයින්ගෙන් අයකර සේවක අර්ථ සාධක අරමුදල වෙත ප්‍රේෂණය කළයුතු රු79,659.ක අර්ථ සාධක අරමුදල් වාරික 33 ක් අදාල ආයතන වෙත නොයවා 2012 දෙසැම්බර් 31 දින සිට විගණනය දිනය වන 2014 ඔක්තෝබර් 27 දින දක්වා පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඌ) ඌව පළාත් යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභ සාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලිබල හා බලශක්ති ජේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2010/ 2011 වර්ෂවලදි ඌව පළාතේ ලියාපදිංචි ක්‍රීඩා සමිතිවලට බෙදා දිම සඳහා මිලදිගෙන තිබුණු ක්‍රීඩා භාණ්ඩ වලින් රු.1,164,685 ක් වටිනා භාණ්ඩ 2015 මැයි 11 විගණන දින වන විටත් බෙදා හැර නොතිබුණි.

(එ) මොනරාගල අධ්‍යාපන කලාපයට අයත් පාසල් 12 ක 2014 අගෝස්තු 31 දිනට ගුණාත්මක යෙදවුම් මුදල් රු. 1,756,828 ක් වියදම් නොකර නිෂ්කාර්යව ගිණුම්වල රඳවාගෙන තිබුණු අතර 2014 නොවැම්බර් 04 දින එම පාසල් 12 සඳහා නැවත ගුණාත්මක යෙදවුම් මුදල් වශයෙන් රු. 1,204,258 ක මුදලක් ලබාදී තිබුණි.

(ඒ) වැලිමඩ හා මොනරාගල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2014 නොවැම්බර් 12 දින වන විට රු. 2,982,908 ක මුදලක් අදාල කාර්ය සඳහා යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ නිශ්කාර්යව රඳවාගෙන තිබුණි.

| තැන්පත් කල කාර්යය | තැන්පත් කල දිනය | තැන්පත් කල මුදල | |
|---|---|---|---|
| | | රු. | |
| ගුණාත්මක යෙදවුම් මුදල් | 2012.02.27 | 2,692,952 | |
| ඒඩ්ස් රෝගය සම්බන්ධ වැඩ සටහන | 2012.01.17 | 121,650 | |
| සිසු රැකුම ශිෂ්‍යාධාර මුදල් | 2011.09.22 | 82,500 | |
| | | ----------- | 2,897,102 |

| | | | |
|---|---|---|---|
| මො/කෙසෙල්කොටුව ක.වි. - විදුලිය ලබාදීම | 2012.12.05 | 43,511 | |
| මො/කළුගහවාඩිය ක.වි. - ජලය සැපයීම | 2012.12.07 | 15,500 | |
| මො/කොන්ගස්පිටිය ක.වි. - දැල් ගැසීම | 2012.12.26 | 26,795 | 85,806 |
| | | --------- | |
| | | | ------------- |
| එකතුව | | | 2,982,908 |
| | | | ======= |

(ඔ) මොනරාගල කලාප අධ්‍යාපන කාර්යාලයේ මුදල් සහකාරට අයත් රජයේ නිවාසය 2012 ඔක්තෝබර් මස සිට මො/රාජකීය මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයාට ලබාදී තිබුණු අතර 2014 ජනවාරි සිට නොවැම්බර් දක්වා මාසික කුලිය රු. 10,725 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

(ඕ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලයට අයත් අංක 19 දරන රජයේ නිවාසයේ පදිංචි වී සිටින නිලධාරියාගෙන් 2006 වර්ෂයේදී තක්සේරු කර අයකරනු ලබන රු. 1,750 ක ආර්ථික කුලිය 2015 මාර්තු 23 දින වන විටත් නැවත තක්සේරු කර නොතිබුණු අතර 2006 වර්ෂයෙන් පසුව රු. 842,189 ක් වැයකර අළුත්වැඩියාවන්ද සිදුකර තිබුණි.

(ක) ආයතන සංග්‍රහයේ **XXII** පරිච්ඡේදය ප්‍රකාරව ඌව පළාත් සභාවේ ආපන ශාලාව, සුභසාධක ආපන ශාලාවක් ලෙස පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. සේවක සුභ සාධනය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබු අතර සුභසාධක ආපන ශාලාවක් ලෙස පවත්වා ගෙන නොගියද නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලයෙන් මේස 11 ක් හා පුටු 26 ක් ආපනශාලාව වෙත නිකුත් කර තිබුණි.

(ග) රු. 654,090 ක් වැයකර ඌව පළාත් සභා පරිශ්‍රය තුළ සවිකර ඇති ආරක්ෂිත කැමරා පද්ධතියේ වගකීම් සහතිකය වලංගු වන කාලය වසරක් බව දක්වා තිබුණද නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය විසින් සැපයුම්කාර ආයතනය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. ආරක්ෂිත කැමරා පද්ධතිය සවිකිරීමට අදාලව ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කරගෙන නොතිබු අතර ආරක්ෂිත කැමරා පද්ධතිය තුළ ගබඩා වී පවතින දත්ත දින 18 කින් පසුව ස්වයංක්‍රීයව ඉවත්වන බැවින් පිරිවිතර සකස් කිරීමේදී දත්ත ගබඩා කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වා නොතිබු බව නිරීක්ෂණය විය. ආරක්ෂිත කැමරා පද්ධතිය සවිකිරීමේදී ප්‍රසම්පාදන කමිටුව තීරණය කළ මිලට අමතරව රු. 43,890 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ච) බ/පස්සර ගමේවෙල ජයන්ති විද්‍යාලයේ විදුහල්පතිවරයාව සිට 2013 මැයි 02 දින පස්සර ජාතික පාසැලේ නියෝජ්‍ය විදුහල්පතිවරයා ලෙස ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරියා පළාත් සභා මුදල් රීති 755.1 ප්‍රකාරව සියළුම ඉන්වෙන්ට්‍රි අයිතම මාස 11 කට පසුව අනුප්‍රාප්තිකයාට භාරදී තිබුණි. නව විදුහල්පතිවරයාට භාණ්ඩ භාරදීමේදී අයිතම වර්ග 08 ක් සම්බන්ධයෙන් ඌනතාවයක් ද අයිතම වර්ග 03 ක් සම්බන්ධයෙන් අතිරික්තයක් ද පැවතුණි. පාසැල් සංවර්ධන සමිතියට අදාල මුදල් පොත්, ගෙවීම් වවුචර්පත්, ලදුපත්, පොදු 219 පිටපත් සහිත පොත්, පාසැල් සංවර්ධන සමිතියට අදාල අංක 04 දරන චෙක්පොත ආපසු භාරදී නොතිබුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

(අ) ඌව පළාත් සභාවේ යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රීඩා මධ්‍යස්ථාන සඳහා ක්‍රීඩා භාණ්ඩ මිලට ගැනීමට 2013 අගෝස්තු 15 දින රු. 25,000 ක මුදලක් එවා තිබුණි. උපදෙස් ප්‍රකාරව ක්‍රීඩා උපකරණ මිලදී ගෙන 2013 ඔක්තෝබර් 30 දිනට පෙර අමාත්‍යාංශය වෙත බිල්පත් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද, 2014 දෙසැම්බර් 20 විගණන දිනය දක්වාත් මිලදී ගැනීම් සිදු කර නොතිබුණි.

(ආ) වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ද්විතියක පාසල් සඳහා ඉගෙනුම් ප්‍රවර්ධන අරමුදල් යටතේ එක් පාසලකට රු. 30,000 ක් බැගින් අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි.

පළාත් සභා මුදල් රීති 371.2.2 ප්‍රකාරව අදාල කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවිය යුතු වුවත් පාසල් 09 කට ලබා දුන් රු. 270,000 ක අත්තිකාරම් පියවා නොතිබුණි.

(ඈ) වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලයට විවිධ වැඩසටහන් යටතේ ලැබුණු රු.12,670,756 ක් වියදම් නොකර 2015 අප්‍රේල් 02 දිනවන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) විසිරි ඉඩම් කච්චේරි මඟින් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තෝරාගත් බදුකරුවන්ගේ බදුකර 07 කට ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා 2011 ජුනි 20 හා 2011 නොවැම්බර් මාසයන්හි බදු අනුමත කරන ලිපි ලබාදී, බදුකර ලබාදීමේ ඉදිරි කටයුතු කරන ලෙස දන්වා තිබුණි. 2015 පෙබරවාරි 09 දින වන විටද බදු අනුමත කල ලිපිවල ඇතුලත්ව තිබුණ උපදෙස් කිසිවක් ඉටුනොකර බදුගොනු අක්‍රීය තත්වයේ තබා තිබුණි.

(ඉ) ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගබඩාවට 2013 දෙසැම්බර් 30 දින ලැබී තිබූ ශබ්ද විකාශන යන්ත්‍රයක් 2014 අගෝස්තු 22 දින වන විටද, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගබඩාවට 2013 දෙසැම්බර් මස ලැබී තිබූ වර්ග 04 කට අයත් භාණ්ඩ / උපකරණ ඒකක 277 ක් 2015 මාර්තු මස 23 දින වන විටද අදාල ප්‍රතිලාභීන් වෙත ලබාදී නොතිබුණි.

(ඊ) 2013 වර්ෂයේ දී ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත වෛද්‍ය ප්‍රතිකාර සහ ස්වයංරැකියා ආධාර වශයෙන් ලැබුණු රු. 40,000 ක මුදලක් අදාල කාර්යයට යෙදවීමකින් තොරව 2014 නොවැම්බර් 27 විගණන දිනය දක්වාම බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(උ) වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලය සඳහා 2014 වර්ෂයට වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදන වලින් කලාපය තුළ පැවැත්විය යුතු වටිනාකම රු. 2,211,158 ක්වූ වැඩ සටහන් 40 ක් විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 12 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඌ) බ/පස්සර ගමේවෙල ජයන්ති විද්‍යාලයේ 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල අනුව විභාගයට පෙනී සිටි සිසු සංඛ්‍යාවට සාපේක්ෂව සමත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 14 ත් සියයට 30 ත් අතර අගයක් ගෙන තිබුණි. 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව ගණිතය විෂයය සමත් සංඛ්‍යාව සියයට 0 සිට සියයට 10 ක් වී තිබුණු අතර එම කාලය තුළ විභාගයට පෙනී සිටි එකම ශිෂ්‍යයෙක්වත් ඉංග්‍රීසි විෂය සමත් වී නොතිබුණි. 2013 හා 2014 වර්ෂවලදී කලාප අධ්‍යාපන කාර්යාලයේ සහ කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ විෂය අධ්‍යක්ෂවරු විසින් පාසල අධීක්ෂණය කර නොතිබුණි.

(එ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සියලුම වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. අංක 28-2866 දරන ලොරි රථය 2013 ඔක්තෝබර් 09 වන දිනෙන් පසුව 2014 නොවැම්බර් 07 විගණන දිනය දක්වාම ධාවනයේ යෙදවීමකින් තොරව අනාරක්ෂිත ලෙස කාර්යාල භූමියේ නවතා තිබුණි.

(ඒ) බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 78 ක් සඳහා ලැබී තිබූ ගුණාත්මක යෙදවුම් රු. 15,392,995 ක් විගණන දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

6.4 මූල්‍ය කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------------

(අ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය විසින් 2015 ජනවාරි 23 දින වන විට රු. 5,463,400 ක මුදලක් අදාල කාර්ය සඳහා යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ නිශ්කාර්යව රඳවාගෙන තිබුණි.

(ආ) ඌව පළාත් සභා සංකීර්ණයට 2014 වර්ෂය සඳහා පවිත්‍රතා සේවය සැපයීම වෙනුවෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) විසින් ඇතිකරගත් ගිවිසුමේ පළමු වගන්තියට අනුව සම්පූර්ණ ගිවිසුම්ගත වාර්ෂික මුදල ඉක්මවා රු. 368,774ක් වැඩිපුර ගෙවා තිබුණි.

6.5 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම
-----------------------------------------------

ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව
------------------------------------------------

(අ) කුට්ටියගොල්ල පාසල් මාර්ගය සංවර්ධනය
---------------------------------------------

රු. 1,831,571 ක මුදලක් ගෙවා තිබූ මෙම මාර්ගය අලුතින් ගල් අතුරා තාර දැමීමක් ලෙස සිදුකර තිබුණු නමුත් බොහෝ ස්ථානවල තාර යොදා තිබුණේ මිලි මීටර් 100 ගල්මතය. ඒ අනුව මිලි මීටර් 37.5 ක් හා මිලි මීටර් 12 ගල් ඇතිරීම සඳහා කල වියදම පිළිබඳව විගණනයයේදී සෑහීමකට පත්විය නොහැකි විය. මාර්ගයේ ආරම්භයේ සිට මීටර් 36 ක් ගිය තැන වර්ග මීටර් 07 ක් පමණ මාර්ගය ඉරිතලා ගිලා බැස තිබූ අතර මීටර් 51 ක් ගිය තැනද මාර්ගය ගිලා බැස තිබුණි.

(ආ) බදුල්ල, කුට්ටියගොල්ල,කහටරුප්ප,ඉලිපතුතැන්න මාර්ගය
----------------------------------------------------------------

රු. 3,604,775 ක මුදලක් ගෙවා තිබූ මෙම මාර්ගය ආරම්භයේ සිට මීටර් 749 ක් ගිය තැන මාර්ගයේ ස්ථාන තුනක් ගිලා බැස සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි.

(ඇ) මහියංගණ සුසාන භූමි මාර්ගය
--------------------------------

මෙම කර්මාන්තය සඳහා එක්තරා ආයතනයක් සමඟ 2014 අප්‍රේල් 08 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ව්‍යාපෘතියට අදාලව සිදුකරන ලද පරික්ෂාවේදි පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(I) 100 mm හා 37.5 mm ගල් කැබලි අතර ගල් කුඩු පැවතීම හේතුවෙන් එක් එක් ස්ථරයන් අතර සම්බන්ධතාවයක් නොමැති වීමෙන් මාර්ගයේ ශක්තිමත්බව ඉතා දුර්වල මට්ටමක පැවතුණි .

(II) මාර්ගයෙහි බොහෝ ස්ථාන වල කොටස් ඉරිතලා ගිලා බැස තිබුණි.

(III) මාර්ගයේ ආරම්භයේ 37m ක් හා 64m ක් අතර දිග 27m ක්වූ මාර්ග කොටසක් සම්පූර්ණයෙන් ගිලා බැස වළවල් හැරී බොරළු යෙදූ ස්තරය මතුවී තිබුණි .

(ඈ) පහත රත්කිඳ උල්හිටිය මාර්ගය - ගල් අතුරා තාරදැමීම
----------------------------------------------------------

උක්ත මාර්ගය ඉදිකිරීම් ව්‍යාපෘතිය වෙනුවෙන් රු 694,360.ක වියදමින් මාර්ගය හරහා බෝක්කුවක් ඉදිකර තිබූ අතර එම ඉදිකිරීම සම්බන්ධයෙන් පහත තත්වයන් නිරීක්ෂණය කෙරේ.

(I) මාර්ගය හරහා යොදා තිබූ බෝක්කුවෙහි ජලය බැසයාම ඊට පහලින් ඇති පිවිසුම් මාර්ගයකට යොමුකර තිබීමෙන් ඉන් බැහැර වන ජලයෙන් එම මාර්ගය දැඩි ලෙස සෝදා පාළුවට ලක්ව තිබුණි.

(II) මෙම බෝක්කුව ඉදිකිරීම නිසා ඉන් ගලා යන ජලයෙන් යාබද පිවිසුම් මාර්ගයට හා වාරි ජලය ලබාගන්නා ඕ ඇළේ ඉවුරට හානි සිදුවීම නිසා ගම්වාසීන් විසින් වැලිකොට්ට යොදා බෝක්කුව තුළින් ජලය ගලා නොයන ලෙස අවහිර කර තිබුණි. මේ අනුව මෙම ඉදිකිරීම සඳහා ගෙවන ලද රු. 694,360 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

6.6 වත්කම් කළමනාකරණය

6.6.1 ගබඩා කළමනාකරණ දුර්වලතා

(අ) ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් පාලනය වන ආයතන 05 ක ගබඩා භෞතිකව නියැදි පදනම මත කළ පරීක්ෂාවේදී රු.244,936 ක් වටිනා ශල්‍ය උපකරණ හා ඖෂධ තොග විෂයන් 30 ක ඌනතාවයක් හා රු.1,146,337 ක් විෂයන් 23 ක අතිරික්තයක් පැවතුණි.

(ආ) වැලිමඩ මූලික රෝහලට ඖෂධ ගබඩා කිරීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිවීම නිසා ඩිස්පෙන්සරිය ආසන්නයේ අනාරක්ෂිතව පැරසිටමෝල් ඖෂධ තොගයක්ද, රු.31,980 ක් වටිනා සොෆ්රමයිසින් ඖෂධ තොගයක්ද වේයන්ගේ ග්‍රහණයට හසුවෙමින්ද, රු.197,903 ක් වටිනා නෝමල් සේලයින් 3650 ක් පැරණි මෘත ශරීරාගාරය තුළද, බාහිර රෝගී අංශයෙහි ස්ථාපිත කොට ඇති රෝගී වැසිකිළිය ප්‍රයෝජනයට නොගෙන එය ඔක්සිජන් තොගයක්ද අවිධිමත් ආකාරයෙන් ගබඩා කර තිබුණි.

(ඇ) වැවේගම දිසා රෝහලේ ඖෂධ ගබඩාව තුළ රු.130,396 ක් වටිනා කල් ඉකුත්වූ සහ භාවිතයෙන් ඉවත් කරන ලද ඖෂධ සහ කල් ඉකුත්වූ රු.8,204 ක් වටිනා ත්‍රිපෝෂ තොග පැවතුණි.

6.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සඳහා ගණිත උපකරණ මිලදී ගැනීමේදී මිලගණන් ඉදිරිපත් නොකරන ලද උපකරණ සඳහා රු. 227,950 ක් ගෙවා තිබුණි.

6.8 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මුදල් රීති 137(2) හා 156(7) ප්‍රකාරව කටයුතු නොකර 2013 ඔක්තෝබර් 01 දින සිට 2014 අගෝස්තු 31 දක්වා ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් පැමිණීම සනාථ කිරීමේ ලේඛනය පරීක්ෂා කිරීමකින් තොරව ආරක්ෂක නිලධාරීන් 272 ක් සඳහා රු.194,409 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පිරිසිදු කිරීමේ සේවාවේ නියුතු සේවකයින් වෙනුවෙන් දෛනික පැමිණීමේ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. 2013 ජූනි සිට 2014 අගෝස්තු දක්වා නියමිත සේවක සංඛ්‍යාව නොයෙදවීම මත රු.377,766 ක්ද, අතිකාල වශයෙන් රු.232,281 ක්ද වැඩිපුර ගෙවා තිබූ අතර දඩ වශයෙන් පුද්ගලයෙකුට රු.100 බැගින් අයකරගත යුතු රු.80,600 ක දඩ මුදල අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) වැලිමඩ මූලික රෝහලට අයත් අංක 52 – 4729 දරණ කැබ් රථයේ මයිලෝ මීටරය ක්‍රියාවිරහිතව පවතින අතර එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බදුල්ල නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ගබඩාව සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී වාර්ෂිකව සැපයිය යුතු භාණ්ඩ සැපයුමෙන් රු.51,874 ක් වටිනා භාණ්ඩ සපයා නොතිබූ නමුත් බිල්පත් ගෙවීමේදී සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ බව අනාවරණය විය.

(ඉ) ඌව පළාත් සහා වාහන නඩත්තු ඒකකයේ තාක්ෂණ නිලධාරි විසින් අංක 250-7849 දරන කැබ් රථයේ අළුත්වැඩියාව සම්බන්ධයෙන් කරුණු 10 ක අඩුපාඩු පෙන්වා දී තිබුණද එය නොසලකා අළුත්වැඩියා කරන ලද ආයතනයකට එකඟවූ රු. 393,900 ක් වූ මුළු මුදලම ගෙවා තිබුණි.

(ඊ) රජයේ නිවාස සඳහා පළාත් සභා අරමුදලින් ගෘහභාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සඳහා විධිවිධාන සලසා නොමැති නමුත් රත්වත්ත මාවතේ පිහිටි, රජයේ නිවාසයකට රු. 27,080 ක් වැයකර උණුවතුර ගීසරයක් මිලදී ගෙන තිබුණි.

(උ) පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව Note Book පරිගණක මිලදී ගැනීම අනුමත කර තිබු නමුත් රු. 448,000 ක් වැයකර මාණ්ඩලික නිලධාරින් 04 දෙනෙකු සඳහා ජංගම දුරකථන මිලදී ගෙන තිබුණි. මිලදීගත් ජංගම දුරකථන සඳහා මිලගණන් කැඳවීමේදී මෙම ජංගම දුරකථන දේශීය වශයෙන් ගෙන්වා බෙදාහරින ආයතනයන්ගෙන් මිලගණන් කැඳවීම් කර නොතිබුණු අතර මිලදී ගෙන තිබු ජංගම දුරකථන නියම තත්ත්වයේ (Genuine Product) නිෂ්පාදන බවට තහවුරු කරගෙන නොතිබුණි. එසේම මේ සඳහා නිෂ්පාදකයාගේ වගකීම් සහතිකයක් වෙනුවට අලෙවි ආයතනයේ වගකීම් සහතිකයක් ලබාගෙන තිබුණි.

(ඌ) 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව 2012 ජනවාරි මස සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරින්ට රු. 15,000 ක දීමනාවක් ගෙවිය යුතු වුවද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නොවන නිලධාරියෙකු වන පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂවරයාට 2012 ජනවාරි සිට 2014 ඔක්තෝබර් දක්වා රු. 508,548 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණු අතර 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 ඇ ඡේදය ප්‍රකාරව සියලු දීමනා හා දිරිකාරක ගෙවීම් පිළිබඳ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් ලබාගත යුතු වුවද එසේ උපදෙස් ලබාගැනීමකින්ද තොරව මෙම දීමනාව ගෙවා තිබුණි.

(එ) 2014 මැයි 04 දින සිට මාස 06 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබු විශ්‍රාමික පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂවරයාට 2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වැටුප් හා දීමනා ගෙවිය යුතු වුවද එයට පටහැනිව වැටුප් හා දීමනා තීරණය කර 2014 ඔක්තෝබර් වන විට රු. 263,474 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඒ) 2011 ජුලි 26 දිනැති අංක 2011/ 01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යාපනය සඳහා මුදල් වියදම් කළ යුතු සංවර්ධන කාර්යයන් සඳහන් කර තිබු නමුත් එම උපදෙස්වලට පටහැනිව බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 495,700 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගෙන පාසලකට නිකුත් කර තිබුණි.

6.9 දෘශ්‍ය අක්‍රමිකතා

------------------

(අ) දියතලාව ආයුර්වේද රෝහලට ආරක්ෂක සේවාව සපයන ආයතනය ඊට අමතරව දියතලාව මුලික රෝහලටද ආරක්ෂක සේවාව සපයා ඇති අතර එක් දිනයකදී එක් නිලධාරියෙකු ස්ථාන දෙකෙහිම සේවය කොට ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව රු.48,066 ක මුදලක් ආයතන 02 කින් වංචා සහගත ලෙස ලබාගෙන තිබුණි.

(ආ) ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවකයින් 2013 මාර්තු 01 සිට 2013 දෙසැම්බර් 22 දින දක්වා රු.124,347 ක් වටිනා අතිකාල දිමනා වැඩිපුර ලබාගෙන තිබුණි.

(ඇ) ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් හුදකලා ගම්මාන සංවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතිය යටතේ 2014 ජුලි 05 දින රු.161,000 ක සිමෙන්ති මළු 184 ක් මිලදි ගෙන 2014 ජුනි 29 දිනදී එම ද්‍රව්‍ය ලැබුණු බවට තොග පොතේ සටහන් කර තිබුණි. මුදල් රෙගුලාසි ප්‍රකාරව තොග සහතිකයක්ද සහිතව ගෙවීම් අනුමත කර, ගෙවීම් සිදුකර තිබු නමුත්, 2014 අගෝස්තු 22 දින වන විටත් ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී නොතිබුණි.

(ඇ) බ/පස්සර ගමේවෙල ජයන්ති විද්‍යාලයේ විදුහල්පතිවරයා 2013 මැයි 02 දින පස්සර මධ්‍ය මහා විද්‍යාලයට ස්ථාන මාරුවී ගියද චෙක්පොත් අනුප්‍රාප්තිකයාට භාරදී නොතිබුණි. විදුහල්පතිවරයා ස්ථාන මාරුවී ගොස් දින 34 කට පසු 2013 ජුනි 04 දින වංචනික ලෙස ඔහුගේ අත්සනින් පාසල් සංවර්ධන සමිති ගිණුමට අයත් රු. 22,000 ක් වටිනා චෙක්පත් බැංකුව වෙත ඉදිරිපත් කර මුදල් ලබාගෙන තිබුණි.

6.10 අරමුදල් ඌන උපයෝජනය

-------------------------------

ඌව පළාත් යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභ සාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලිබල හා බලශක්ති පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය ක්‍රීඩා සංවර්ධනය හා උපකරණ මිලදී ගැනීම සඳහා ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26 කට ලබාදෙන ලද රු.30,000 බැගින් වූ රු. 780,000 ක මුදල 2015 අප්‍රේල් 20 විගණන දින වන විටත් අදාල කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි.

6.11 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කාබනික පොහොර භාවිතය දිරිගැන්වීම වැඩසටහන යටතේ රු.70,805 ක් වටිනා කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍රයක් ලබාදී තිබුණද 2015 පෙබරවාරි 13 වන විටත් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) සුජාතා සෙවන ළමා නිවාසයේ ජල සැපයුම් පද්ධතිය හා ළිඳ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් රු.1,269,326 ක් හා විදුලි පහසුකම් ලබාගැනීම වෙනුවෙන් රු.42,375 ක් වශයෙන් රු.1,311,701 ක මුදලක් වැයකර ඇති නමුත් ජල සැපයුම් පද්ධතිය භාවිතා නොකිරීම හේතුවෙන් එය නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සිදුකිරීමේ පරමාර්ථය වූයේ අධික වූ ජල බිල්පත අවම කර ගැනීම වුවද ජල සැපයුම් පද්ධතිය ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් 2014 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුල ජල බිල්පත් වශයෙන් රු.490,256 ක් ගෙවා තිබුණි.

(ඇ) පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල සමුපකාර සමිති ශක්තිමත් කිරීමේ වැඩසටහන සඳහා රු.489,204 ක වියදමක් 2013 වර්ෂයේදී දරා තිබුණද 2014 සැප්තැම්බර් 01 විගණන අවස්ථාව වන විටත් සමුපකාර සමිති 03 කට ලබාදී ඇති රු.50,000 ක මුදලක් සහ රු.99,625 ක් වටිනා උපකරණ උපයෝජනය කර නොතිබුණි.

(ඈ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රූඩ් 3 පර්චර්ස් 18.5 ක්වූ කුඩා මුත්තෙට්ටුව නැමැති ඉඩම අත්පත් කර ගැනීම සඳහා බදුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත රු. 2,283,000 ක් ගෙවා තිබුණද 2015 මාර්තු 30 දින වන විටත් මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් කොමිෂන් සභාවේ මුදල් රු. 2,283,000 ක් වසර 05 ක් තිස්සේ නිශ්කාර්යව බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබීමෙන් වෙනත් ඵලදායි කටයුත්තක් සඳහා භාවිතා කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

6.12 හඳුනාගන්නා ලද පාඩු

------------------------

බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් වෑන් රථයක් 2013 වර්ෂයේ දී අවස්ථා 03 ක දීම අනතුරට පත්වී තිබුණි. ඒ සඳහා අලුත්වැඩියා වියදම රු. 350,345 ක් වූ අතර ප්‍රතිපූර්ණය නොවූ රක්ෂණ වන්දිය රු. 35,332 ක් විය.

6.13 අරමුණින් පරිබාහිර ක්‍රියාකාරකම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත තුළ හුදකලා වූ ගම්මානයන්ගේ ජීවත්වන ජනතාවගේ සමාජ තත්ත්වය වැඩිදියුණු කරලීම උදෙසා හුදකලා ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා ප්‍රතිපාදන සලසා තිබෙන නමුත් ඉන් පරිබාහිර වූ මෙම වැඩසටහනේ අරමුණුවලට අදාල නොවන කාර්යාලයීය අවශ්‍යතා වෙනුවෙන් අමාත්‍යාංශය රු. 13,402,752 ක මුදලක් වැය කර තිබුණි.

(ආ) පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ II වන අදියර ඉදිකිරීම් සඳහා සමාලෝචිත වර්ෂයේදී වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් රු. 2,000,000 ක් අරමුණින් පරිබාහිර කටයුත්තක් වන ප්‍රධාන ලේකම් කාර්යාලය සැකසීම වෙනුවෙන් වැය කර තිබුණි.

(ඇ) රණවිරුවන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් මුදල් ලබාදීම සඳහා රණවිරු කොඩි අලෙවි කර තිබූ අතර එසේ ලැබුන මුදලින් 2011 නොවැම්බර් මාසයේදී රු. 1,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට අදාල උපචිත පොලියද සමඟ එම තැන්පතුව රු. 1,340,751 ක් වී තිබූ අතර රණවිරු සුභසාධනය වෙනුවෙන් ලැබුණු මුදල් අදාල අරමුණ සඳහා යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6.14 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කර්මාන්ත සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වැඩ පරිපාලක වැටුපට අමතරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් විශ්‍රාමික තාක්ෂණික නිලධාරීන්ගේ වැටුප ලෙස රු.211,500 ක් ඇස්තමේන්තුවට ඇතුලත් කර සදොස් ලෙස ඇස්තමේන්තු සකස් කර තිබූ අවස්ථා 07 ක් පැවතුනි.

(ආ) දෙමෝදර වෛද්‍ය නිලධාරී නිල නිවස අළුත්වැඩියාව පළමු අදියරේදී අයිතම අංක 13 යටතේ මිලිමීටර් 20 ක ඝනකම මිලිමීටර් 225 ක පළල වඩිම්බු සපයා සවිකිරීම වෙනුවෙන් මීටර් 47.39 ක් වෙනුවෙන් රු.24,406 ක් ගෙවා තිබුණ අතර දෙවන අදියරේදීද අයිතම අංක 08 යටතේ එම වැඩ කොටස සඳහාම නැවත ගෙවීම් සිදුකර තිබුණි.

(ඇ) දෙමෝදර ප්‍රාදේශීය රෝහලේ කම්බි වැට ඉදිකිරීමේ කර්මාන්තයේ අයිතම අංක 02 යටතේ පැරණි කම්බි කණු 130 ක් ගලවා ඉවත් කිරීම වෙනුවෙන් රු.45,500 ක්ද අයිතම අංක 03 යටතේ පැරණි කටු කම්බි ඉවත් කිරීම සඳහා කටු කම්බි මීටර් 4,006 ක් වෙනුවෙන් රු.60,090 ක්ද ගෙවා තිබුණි. නමුත් ඉවත් කර තිබූ කම්බි කණු කිසිවක් රෝහලට භාරදී නොතිබූ අතර ඉවත් කර තිබූ කටු කම්බි වලින් ඉතා කුඩා කොටසක් පමණක් රෝහල් භූමියේ ගොඩ ගසා තිබුණි.

(ඈ) 2011 වර්ෂයේ ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයේ වාර්තාවට අනුව වැවේගම ප්‍රදේශය නායයාමේ තර්ජනයට භාජනයවී ඇති ප්‍රදේශයක් බවත් ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට නුසුදුසු ප්‍රදේශයක් ලෙසත් නිර්දේශ කර තිබුණි. එසේ තිබියදීත් 2012 ජුනි 18 දින වැවේගම දිසා රෝහලට රු.973,281 ක් වැය කර නව බාහිර රෝගී අංශයක් ඉදිකොට 2013 පෙබරවාරි 18 දින එය විවෘත කර තිබුණි. එහි කොටසක ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබූ බවත් බිත්ති පිපිරීමට ලක්ව තිබූ බවත් ගොඩනැගිල්ලෙහි අවට ප්‍රදේශයේ මතුපිට ජලය කාන්දු වෙමින් පැවැති බවත් භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

6.15 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------

6.15.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව
------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාල
(පාසැල් කාර්ය මණ්ඩලය හැර)

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1141 | 733 | 408 | - |
| (ii) | තෘතියික මට්ටම | 348 | 246 | 102 | - |
| (iii) | ද්විතික මට්ටම | 6487 | 4786 | 1701 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4558 | 4550 | 08 | - |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 45 | 257 | - | 212 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| (i) | විදුහල්පතිවරුන් | 1011 | 857 | 154 |
| (ii) | ගුරුභවතුන් | 16334 | 16120 | 514 |
| (iii) | සහය කාර්ය මණ්ඩලය | 1944 | 1422 | 522 |

(ඇ) ඉහත සහය කාර්ය මණ්ඩලයට අයත් පාසල් කාර්ය සහයක තනතුර සඳහා අනුමත සංඛ්‍යාව ඉක්මවා 420 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඈ) 2007 මැයි 11 දිනැති අංක 2007/09 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ හා 2010 ඔක්තෝබර් 13 දිනැති අංක CSA/6/6/10/5 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ විධිවිධානයන් හා උපදෙස් ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව ඌව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික කාර්මික නිලධාරීන් 06 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි. මොනරාගල දිස්ත්‍රික් මිල කමිටුව තීරණය කරගත් දෛනික දීමනාවක් පදනම් කර ගෙන 2009 දෙසැම්බර් 01 සිට 2014 අගෝස්තු 27 දින දක්වා මොවුන්ට රු.4,074,900 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඉ) ඌව පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ සුජාතා සෙවන ළමා නිවාසයේ සහකාර මේට්‍රන් තනතුර සඳහා 2010 මැයි 24 දින ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් අනුමත කර තිබුණි. එහි විධිවිධාන ප්‍රකාරව සහකාර මේට්‍රන් තනතුර සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ප්‍රසිද්ධ දැන්වීම් පළකර අයදුම්පත් කැඳවා ලිඛිත පරීක්ෂණයකට භාජනය කර ලකුණු වල ප්‍රමුඛතාව මත සුදුසුකම් පරීක්ෂා කර බඳවාගත යුතු වුවද 2012 සැප්තැම්බර් 01 දින එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත අයකු බඳවාගෙන ඇයගේ සේවා කාලය 2013 අගෝස්තු 31 දින දක්වා දීර්ඝ කර තිබු අතර 2013 සැප්තැම්බර් 27 දින ඇය සහකාර මේට්‍රන් (III) ශ්‍රේණියට පත්කර තිබුණි.

(ඊ) ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියේ 09 ඡේදයේ විධිවිධානවලට පටහැනිව ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාස මාතා තනතුරට 17 දෙනෙකු බඳවා ගෙන වැටුප් හා දීමනා වශයෙන් 2014 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.3,038,886 ක් ගෙවා තිබුණි.

(උ) 2013 -2015 ඌව පළාත් සභාවේ කාර්ය මණ්ඩල වාර්තාව අනුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලයේ සංවර්ධන නිලධාරීන් 15 දෙනෙකුගේ අතිරික්තයක් පැවති අතර 2014 වර්ෂය තුළ පමණක් එම නිලධාරීන් වෙනුවෙන් රු. 4,228,788 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඌ) පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලයට අයත් නක්කල සේවා මධ්‍යස්ථානය වෙත 2014 ජුනි 16 දින සිට 2014 නොවැම්බර් 05 දින දක්වා කිසිදු රාජකාරියක් පැවරීමකින් තොරව යන්ත්‍ර ක්‍රියාකරු සහයකයින් දෙදෙනෙකු අනුයුක්ත කර තිබු අතර 2014 නොවැම්බර් 05 දින වන විටත් එම මධ්‍යස්ථානයේ කාර්යයන්ද ආරම්භ කර නොතිබුණි. ඒ අනුව මෙම යන්ත්‍ර ක්‍රියාකරු සහයකයන් දෙදෙනාට එකී කාලය තුළදී ගෙවන ලද රු. 184,149 ක්වූ වැටුප් හා දීමනා නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

6.15.2 අධ්‍යාපන සම්බන්ධ කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 අප්‍රේල් 06 විගණන දිනට වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්ය මණ්ඩල තුල විවිධ තනතුරුවල අතිරික්තතා 38 ක් ද, පුරප්පාඩු 13 ක් ද, පැවතුනි.

(ආ) වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ "සැලසුම් නිලධාරි" තනතුරක් ඇතිකර ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරිණියක් ඒ සඳහා පත්කර 1992 ඔක්තෝබර් 15 දින සිට ගුරු සේවයේ වැටුප් ගෙවමින් ඌව පරණගම කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කර සේවයේ යොදවාගෙන තිබුණි.

(ඇ) වැලිමඩ අධ්‍යාපන කලාපයට අයත් පාසල් 49 ක ශ්‍රී ලංකා ගුරු සේවයේ I ශ්‍රේණියේ සිට 3-II ශ්‍රේණිවල ගුරුවරුන් වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස පත්කර තිබුණි.

(ඈ) ගුරු සේවයේ නිලධාරීන් වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස කටයුතු කළද වැලිමඩ අධ්‍යාපන කලාපයේ පාසල් 11 ක විදුහල්පති සේවයේ නිලධාරීන් 16 දෙනෙකු නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ලෙස කටයුතු කරන බව නිරීක්ෂණය විය.

(ඉ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ හා විදුහල්පති සේවයේ නිලධාරින් 151 දෙනෙකු 2015 මැයි මාසය වන විටත් ජාතික පාසැල්වලට අනුයුක්ත කර තිබූ අතර ඌව පළාත් සභා පාසැල්වල විදුහල්පති සේවයේ තනතුරු පුරප්පාඩු පැවතියදී ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2-II ශ්‍රේණියේ අයකු ජාතික පාසැලක නියෝජ්‍ය විදුහල්පති තනතුරට අනුයුක්ත කර තිබුණි.

(ඊ) මො/තෙනගල්ලන්ද මහා විද්‍යාලයේ 2014 නොවැම්බර් මාසය වන විට නැටුම් හා සංගීතය යන විෂයයන් සඳහා ගුරුවරුන් තිදෙනෙකුගේ අතිරික්තයක් පැවතුනි.

(උ) 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන පාසලක ගුරු අවශ්‍යතාවය සපිරීමේ අරමුණින් ගුරු සංඛ්‍යාව නිර්ණය කිරීමේ චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව මො/මැදිරිය රාජ්‍යානන්ද මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරුන් දෙදෙනෙකු කිසිදු කාලපරිච්ඡේදයක ඉගැන්වීමේ නිරත වී නොතිබුණි. මීට අමතරව ගුරුවරුන් 03 දෙනෙකුට 2014 නොවැම්බර් 13 දින වන විටත් ඉගැන්වීම සඳහා කිසිදු කාලපරිච්ඡේදයක් ලබාදී නොතිබූ අතර එම කාලය තුළ ඔවුන්ට ගෙවන ලද රු. 676,788 ක වැටුප් හා දීමනා නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ඌ) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.4 උපවගන්තිය ප්‍රකාරව තනතුරක වැඩබැලීම සඳහා තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් නොලද අයෙකු පත් නොකළ යුතු වුවද එයට පටහැනිව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරුවලට බඳවා ගැනීම් අවස්ථා 07 ක් නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින්ද මේ අතර වූ බැවින් ඔවුන් පාසල් කාර්ය මණ්ඩල තුළම රඳවාගෙන ගුරු වැටුප් ගෙවමින් පූර්ණ කාලීනව පරිපාලන කටයුතු වල යොදවා තිබුණි.

(එ) විධිමත් විනය පරීක්ෂණයකදී වරදකරු වී වැටුප් වර්ධක 02 ක් විලම්බනය කරනු ලැබූ නිලධාරියකුට විනය පරීක්ෂණ පැවැත්වූ කාලවකවානුවද ඇතුළත්වන පරිදි වැටුප් රහිත නිවාඩු සහිතව ද්විතීයන පදනම මත ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණ තනතුරක් සඳහා මුදාහැර තිබුණි.

(ඒ) ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවක් පදනම් කරගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රාසේකො/දේපානි/2001/4/1/S/268 අංක දරන 2004 නොවැම්බර් 23 දිනැති ලිපියෙන් අධිසේවක පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වැටුප් හිමිකම පමණක් හිමිවන පරිදි පත්වීම් ලබාදී තිබූ නිලධාරියකුට එම විධිවිධාන උල්ලංඝනය කර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරකට පත්කර පහත වරප්‍රසාද පිරිනමා තිබුණි.

- අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4.1.3 ඡේදයේ විධිවිධාන ප්‍රකාර ගෙවීම් කිරීමේ පදනම මත 2013 මාර්තු 26 දින සිට EKSP ව්‍යාපෘතියේ ඌව පළාත් ව්‍යාපෘති කළමනාකරු තනතුරට පත්කිරීම.

- ද්විතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (SEMP) පළාත් ව්‍යාපෘති කළමනාකාර තනතුරට පත්කිරීම.

- අතිරේක පාරිශ්‍රමිකයක් ගෙවීමේ පදනම මත බිබිල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ඉටුකිරීමට පත්කිරීම.

(ඔ) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3(1) ශ්‍රේණියේ නිලධාරියෙකුට ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුළ අනුමත නොවූ පළාත් පුස්තකාල සම්බන්ධීකරණ තනතුරක්ද 2008 ජුලි 23 හා 24 දෙදින තුළ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වැඩ ආවරණ) තනතුරු දෙකක්ද පිරිනමා තිබූ අතර සැලසුම් අංශයේ විෂය සම්බන්ධීකරණ කටයුතු ඉටුකිරීමටද පත්කර තිබුණි.

(ඕ) ශ්‍රී ලංකා ගුරු සේවයේ 2- I ශ්‍රේණියේ නිලධාරියෙකුට ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති "ඉංග්‍රීසි මාධ්‍ය-විද්‍යා විෂය පළාත් සම්බන්ධීකරණ නිලධාරි" තනතුරක් පිරිනමා තිබූ අතර එම තනතුරට අදාලව නිලධාරියා අවස්ථා 02 කදී වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාගෙන විදේශගතවී තිබුණි.

(ක) 2011 නොවැම්බර් 16 දිනැති අංක 24/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර විශ්‍රාමික රජයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත රාජ්‍ය සේවයට බඳවා ගැනීම මාස 06 කට නොවැඩි කාල සීමාවක් සඳහා පමණක් සිදුකළ යුතු විය. නමුත් ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික නිලධාරීන් 04 දෙනෙකු මාස 06 ක කාලය ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවාගෙන වැටුප් හා දීමනා ලෙස රු. 1,561,730 ක් ගෙවා තිබුණි.

(ග) නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරක රාජකාරි ආවරණය කරමින් සිට 2009 සැප්තැම්බර් 13 දින විශ්‍රාමලත් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු 2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2010 මැයි 14 දින සිට නැවත සේවයේ යොදවා තිබුණි.

(ච) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2014 ජනවාරි 01 දිනට අනුමත කාර්ය මණ්ඩලය නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සංඛ්‍යාව 04 ක් වුවද නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරු 09 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ජ) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු අනුව සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු කාණ්ඩය යටතේ අනුමත කාර්ය මණ්ඩලය 85 ක් විය. නමුත් ස්ථිර තථ්‍ය කාර්ය මණ්ඩලය 88 ක් වූ අතර එම තනතුරු කාණ්ඩය යටතේ වැඩ ආවරණය කිරීම සඳහා පත්කර ඇති නිලධාරි සංඛ්‍යාව 50 දෙනෙකු වූයෙන් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 53 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ට) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා කලාප අධ්‍යාපන කාර්යාල 08 සඳහා විවිධ තනතුරු යටතේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවමින් 473 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඩ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා කලාප කාර්යාල 08 සඳහා අනුමත විවිධ තනතුරුවල දැක්වෙන පුරප්පාඩු 829 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ණ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශයේ දත්ත අනුව 2014 ජනවාරි 01 දිනට ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුමත විදුහල්පති තනතුරු 1011 න් 323 ක්ම ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ වැඩ බැලීමේ පත්වීම් වලින් සම්පූර්ණ කර තිබුණි. මෙම 323 දෙනාගෙන් 297 දෙනෙකුම වසර 1 සිට වසර 10 ද ඉක්මවමින් වැඩ බැලීමේ තනතුරුවල නිරතව සිටින බව නිරීක්ෂණය විය.

(ත) අනියම් පදනම මත බඳවාගත් ගුරුවරු 158 දෙනෙකු හා වැඩ බැලීමේ පදනම මත බඳවාගත් ගුරුවරු දෙදෙනෙකු බඳවාගත් ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ද) පාසල්වල ගුරු ඌනතා හා විදුහල්පති තනතුරු පුරප්පාඩු පැවතියදී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂක, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක තනතුරු සහ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂක තනතුරුවල වැඩ ආවරණය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් 39 ක්ද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් 11 දෙනෙකුද සේවයේ යොදවා තිබුණි. තවද ශ්‍රී ලංකා ගුරු සේවයේ 2- 11 නිලධාරියකු වසර 09ක සිට නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කරමින් තිබු අතර 47 දෙනෙකු වසර 5 සිට වසර 21 ද ඉක්මවා රාජකාරි ආවරණය කරමින් සිටි බව නිරීක්ෂණය විය.

6.15.3 සෞඛ්‍ය අංශ සේවාවල කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------------------------------

දියතලාව මූලික රෝහලේ අරක්කැමි තනතුරක් හා ආහාර පිළියෙල කිරීමේ කාර්යය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රමයක් නොතිබු අතර ආහාර නිරීක්ෂිකා තනතුරක්ද ඇතිකර නොතිබුණි.

6.17 වාහන උපයෝජනය

-----------------------

(අ) ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, මිරිදිය ධීවර කර්මාන්ත, ඉඩම්, සංචාරක හා ප්‍රවාහන කටයුතු අමාත්‍යාංශයට අයත් අංක 253-7792 දරන කැබ් රථයේ ධාවන සටහන් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී කාර්යාලීය රාජකාරී හා නිලධාරීන් සමඟ රාජකාරී ලෙස දක්වා කිලෝමීටර් 512 ක් වෙනුවෙන් රු.7,891 ක් වටිනා ඉන්ධන දහනය වූ බව සඳහන් කර තිබුණද වගකිව යුතු නිලධාරීයෙකු විසින් එම ධාවන සටහන් සහතික කර නොතිබුණි.

(ආ) අංක 31-5741 දරන ජීප් රථය 2014 නොවැම්බර් 10 දින බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් නඩත්තු කටයුතු සඳහා රු.490,328 ක මුදලකට පෞද්ගලික ආයතනයක් වෙත භාරදී තිබු අතර මුදල් රෙගුලාසි 702 ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් අංක HH – 7258 දරන ජීප් රථය 2014 මාර්තු 28 දින සිට 2015 ජනවාරි 30 දින දක්වා කාලය තුළ මයිලෝ මීටරය ක්‍රියා විරහිතවී තිබු අතර එම කාලය තුළ කි.මී. 8877 ක් ධාවනය කර රු. 153,884 ක් වටිනා ඉන්ධන ලීටර් 1268 ක් භාවිතා කරතිබු බව ධාවන සටහන් වල සඳහන් කර තිබුණි.

(ඈ) 2013 ජුනි 05 දිනැති අංක PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය හා 2014 ජුලි 14 දිනැති අංක PF/FS/A.Vehi./2009 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් භාවිතා නොකරන ට්‍රැක්ටර් 08 ක් යතුරු පැදි 03 ක් සහ වෙනත් වාහන 02 ක් ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, මිරිදිය ධීවර කර්මාන්ත, ඉඩම්, සංචාරක හා ප්‍රවාහන කටයුතු අමාත්‍යාංශය විසින් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

6.18 බැංකු සැසඳුම්

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැන්පත් කර මාස 06 ක කාලයක් ඉක්මවා තිබුණ උපලබ්ධි නොවූ රු. 2,631,392 ක් වටිනා චෙක්පත් 146 ක් සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) නිකුත් කර මාස 06 ක කාලයක් ඉක්මවා තිබුණ රු. 262,769 ක් වටිනා චෙක්පත් 42 ක් සම්බන්ධයෙන් ඌව පළාත් සභා මුදල් රීති 396.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු සැසඳුම් ප්‍රකාශයන් අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 03 කට අදාලව හඳුනා නොගත් හර රු. 105,200 ක්වූ අතර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 03 කට අදාල හඳුනානොගත් බැර රු. 388,472 ක් විය.

6.19 පළාත් පාලන ආයතන අධීක්ෂණය

---

පළාත් සභාවේ අධීක්ෂණයට හා පාලනයට යටත් වන ඌව පළාත තුළ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 28 ක පහත සඳහන් ඌණතාවයන් නිරීක්ෂණය විය.

6.19.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

ඌව පළාත තුළ පිහිටි පළාත් පාලන ආයතන 28 ක් අතුරින් පළාත් පාලන ආයතන 20 ක් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

6.19.2 හිඟ ආදායම්

---

(අ) 2014 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 237,538,830 ක් විය.

(ආ) 1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතනවලට අයවිය යුතු උසාවි දඩ රු. 86,224,832 ක් හා මුද්දර ගාස්තු රු. 65,084,624 ක් පළාත් පාලන ආයතන වෙත ලැබී නොතිබුණි.

6.19.3 නිකුත් කර තිබුණු අධිහාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්

---

වර්ෂය අවසානයට ඌව පළාතේ පළාත් පාලන බලමණ්ඩලවල නිලධාරීන්ට හා නියෝජිතයන්ට පනවා තිබුණු අධිහාර වෙනුවෙන් රු. 7,097,643 ක් අයවීමට තිබුණි.

7. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

7.1 ක්‍රියාකාරී සැලැස්ම

---

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් සභාව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

7.2 අභ්‍යන්තර විගණනය

---

සමාලෝචිත වර්ෂය සඳහා පහත සඳහන් ආයතන වල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) ඌව ආණ්ඩුකාරවර කාර්යාලය.
(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
(ඇ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය
(ඈ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය
(ඉ) ඌව පළාත් පාලන ආයතන
(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල
(උ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව.
(ඌ) ආයුර්වේද රෝහල් 06 ක්, මධ්‍යම බෙහෙත් ශාලා 19 ක් සහ ඖසු උයන් 01
(එ) මූලික රෝහල් , දිස්ත්‍රික් රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය.

7.3 විගණන හා කළමනාකරණ කමිටු

---

පළාත් සභාවේ මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභාවේ දෙපාර්තමේන්තු, කාර්යාල හා පළාත් පාලන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

7.4 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------
සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඌව පළාත් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියල කර නොතිබුණි.

7.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම
---------------------------------
පසුගිය වර්ෂයන්හි ඌව පළාත් සභාවේ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කළ දිනය | සභාගත කළ දිනය |
|---|---|---|
| 2008 | 2010.08.31 | 2011.01.20 |
| 2009 | 2011.08.27 | 2011.10.13 |
| 2010 | 2012.09.12 | 2012.12.13 |
| 2011 | 2014.02.11 | 2014.06.19 |
| 2012 | 2014.10.14 | 2015.04.23 |

8. පද්ධති හා පාලන
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය
(ඇ) පළාත් සභා සංවර්ධන සැලැස්ම
(ඈ) අභ්‍යන්තර පාලනය
(ඉ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය
(ඊ) සේවක මණ්ඩල කළමනාකරණය
(උ) වත්කම් කළමනාකරණය
(ඌ) කොන්ත්‍රාත් කළමනාකරණය